**දඹුල්ල මහා නගර සභාව.**

**--------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**---------------------------**

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 26 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

ජංගම නොවන වත්කම් පිරිවැය මත ගිණුම්ගත කර ඇති බව හෙළිදරව් කර තිබූ නමුත් මෝටර් රථ හා කරත්ත තක්සේරු වටිනාකම් මත ගිණුම්ගත කර තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ උසාවි දඩ ආදායම් ලේඛනවලට අනුව රු.3,255,178 ක් වුවත් එය රු.3,475,861 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම් රු.220,683 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) පරිගණක වැඩසටහනක් නිර්මාණය කරගැනීමේ ව්‍යාපෘතියට අදාළ ණයහිමියන් රු.88,075 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) තිත්තවැල්ගොල්ල සායන මධ්‍යස්ථානයක් හා කාය වර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව ණයහිමියන් රු.17,649 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) පොදු අරමුදල් යටතේ රු.1,873,890 කට ඉටුකිරීමට ඇස්තමේන්තු පමණක් සකස් කර තිබූ කර්මාන්තයක් ගිවිසුම් අත්සන් කර නොතිබිය දී ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) දේශීය ණය සංවර්ධන අරමුදලට 2017 වර්ෂයට අදාළව ගෙවිය යුතු පොලිය රු.6,941,277 ක් අඩුවෙන් දැක්වීම නිසා එම වටිනාකමින් ගෙවිය යුතු පොලී හා පොලී වියදම් අඩුවෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ කසළ අත්කරත්ත 03 ක් සඳහා වැය වූ රු.118,632 ක මුදල එම ගිණුමට හර නොකර අයහාර වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබූ රු.725,595 ක් වටිනා වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් එම වටිනාකමින් වත්කම් අඩුවෙන් දැක්වුණි.

(ඌ) 2017 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.3,891,500 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා එම වටිනාකමින් ආදායම් හා ලැබිය යුතු ආදායම් අඩුවෙන් දැක්වුණි.

(එ) ලැබිය යුතු කඩ කුලී ගිණුමේ ආරම්භක ශේෂය නිවැරදි කිරීම වෙනුවෙන් එම කඩ කුලී ගිණුමට බැර කර තිබූ රු.3,898,569 ක් වර්ෂයේ ආදායම් ලෙස ගෙන තිබීමෙන් එම වටිනාකමින් ආදායම් වැඩියෙන් දැක්වුණි.

(ඒ) වර්ෂයේ වරිපනම් ආදායම රු.4,054,361 ක් වුවත් ගිණුමට අනුව එය රු.5,132,766 ක් ලෙස දැක්වීමෙන් ආදායම් රු.1,078,405 කින් වැඩියෙන් දැක්වුණි.

(ඔ) මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු අංක 136-60-01-00005434-6 දරන ගිණුමට අදාළ පොලී මුදල රු.1,875,000 ක් ලැබී තිබිය දී ලැබිය යුතු පොලී ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් වර්ෂයේ පොලී ආදායම සහ ලැබිය යුතු පොලී වැඩියෙන් දැක්වුණි.

(ඕ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම් අංක 897291 දරන ගිණුමට අදාළ පොලිය රු.506,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ආදායම් සහ ලැබිය යුතු පොලී එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ක) ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම් අංක 420031100209 හා 420034200009 දරන ගිණුම්වලට පිළිවෙළින් ලැබී තිබූ රු.552,000 ක් හා රු.228,854 ක පොලී මුදල් එම ගිණුම්වල නැවත ආයෝජනය කර තිබිය දී, ලැබිය යුතු පොලී ආදායම් ලෙස සටහන් කිරීම හේතුවෙන් ලැබිය යුතු පොලී රු.780,854 ක් වැඩියෙන් හා ස්ථාවර තැන්පතු එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ග) වාහනයක වටිනාකම දෙවතාවක් ගිණුම්ගත වී තිබීම හේතුවෙන් රු.1,500,000 කින් වාහන ගිණුම වැඩියෙන් දැක්වුණි.

(ච) මහා නගර සභාව සතු වූ ට්‍රැක්ටර් ට්‍රේලර් 05 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඡ) මහා නගර සභාව සතු ඉඩම් කට්ටි 04 ක වටිනාකම වූ රු.460,000 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ට) විවිධ ණයහිමියන් රු.14,850 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.51,689,570ක් වූ ගිණුම් විෂයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.3,385,847 ක අසමානතාවයන් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

(i) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟහිටි කඩකුලී රු.31,596,597 ක් වූ අතර ඉන් රු.28,545,116 ක් වසර 05 කට වැඩි කාලයක් සිට ලැබිය යුතුව තිබුණි.

(ii) හිඟහිටි වරිපනම් රු.6,431,416 ක් වූ අතර ඉන් රු.4,057,874 ක් පෙර වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතුව රු.115,522,731 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ශේෂය රු.107,242,206 ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,278,292 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මු.රෙ 110 | - | හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) මු.රෙ 138 හා 139 | 1,392,930 | ගෙවන නිලධාරියා සෑම විටම සහතික කළ වවුචර් මත පමණක් ගෙවිය යුතු වුවත් නියැදි |

| | | | |
|---|---|---|---|
| | | | පරීක්ෂාවට අනුව සහතික නොකළ වවුචර් මත අවස්ථා 10 කදී ගෙවා තිබූ මුදල රු.1,392,930 ක් විය. |
| | (iii) මු.රෙ 187 | 42,706 | ලද ආදායම් එදිනම බැංකුගත කළ යුතු නමුත් ලැබී මාස 1½ කට වැඩි කාලයක් අත රදවාගෙන තිබූ චෙක්පත්/ මුදල් ඇණවුම් වල වටිනාකමරු.42,706 ක් විය. |
| | (iv) මු.රෙ 342(1) | - | උප පත්‍රිකා පොත් සුක්ෂිත භාරයේ තබා ගැනීමටත් ලේඛනගත කර නිසි පරිදි පරිහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | (i) VIII පරිච්ඡේදයේ 10.1 වගන්තිය | 35,655 | පූර්ව අනුමැතිය ලබානොගෙන නිවාඩු දින රාජකාරී වෙනුවෙන් නගර සභා නිලධාරියෙකුට දින 15 ක් සඳහා රු.35,655 ක් ගෙවා තිබුණි. |
| | (ii) XIX වැනි පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | 19,016 | 2017 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා උපලේඛන ගත නිවාස හිමිකම් ඇති නිලධාරියෙකුගෙන් නිවාස කුලී ලෙස රු.19,016 ක් අය කරගත යුතුව තිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 39,000 | ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් නිලධාරීන්ගේ/ සේවකයන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳ මුද්‍රිත පිටපත් ලබාගෙන පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,518,978 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.124,471,849 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම් 05 ක් සඳහා වාර්ෂික පොලිය 12% බැගින් ලැබෙන විට රු.15,000,000 ක් වූ ස්ථාවර තැන්පතුවට පමණක් 11% බැගින් පොලී අය වී තිබීමෙන් වසරකට රු.150,000 ක පමණ ආදායම් අහිමි වී තිබුණි.

(ආ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු අංක 2-0103-01-99630 දරන ගිණුමට අදාළව ලැබී තිබූ රු.550,000 ක පොලිය මත 8% ක රඳවා ගැනීම් බදු අඩු කර තිබූ අතර මෙලෙස බදු ලෙස අඩු කිරීමට හේතු අනාවරණය කරගෙන නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,220,000 | 12,288,549 | 9,915,007 | 2,373,542 | 12,650,000 | 11,276,178 | 6,541,381 | 1,734,797 |
| කුලී | 14,830,000 | 10,919,569 | 8,996,560 | 1,923,009 | 14,330,500 | 12,788,125 | 11,549,442 | 1,238,683 |
| බලපත්‍ර ගාස්තු | 14,681,000 | 7,621,906 | 6,455,992 | 1,165,914 | 7,991,000 | 7,221,167 | 6,029,067 | 1,192,100 |
| වෙනත් ආදායම් | 36,480,500 | 50,736,413 | 36,918,635 | 13,817,778 | 27,697,000 | 38,846,274 | 22,501,991 | 16,344,283 |
| | 80,211,500 | 81,566,437 | 62,286,194 | 19,280,243 | 62,668,500 | 70,131,744 | 46,621,881 | 20,509,863 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු හිඟ ආදායම් රු.19,280,243 ක් වූ අතර එය බිල්කළ ආදායමෙන් සියයට 23 ක් විය.

### 2.3.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම් රු.4,054,361 ක් වූ අතර ඉන් රු.1,680,819 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු වරිපනම් ආදායම රු.6,431,416 ක් විය.

(ආ) පෙර වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු වරිපනම් ආදායම රු.5,550,673 ක් වූ අතර ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ ආදායම රු.880,743 කින් වැඩි වී තිබුණි.

2.3.4 කුලී

-----

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට බස්නැවතුම්පල කඩ කාමරවලින් ලැබිය යුතු කුලිය රු.15,836,822 ක් වූ අතර කඩකාමර 20 ක් වසාදමා තිබුණි.

(ආ) තොගපොලේ කඩ කාමරවලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු.492,067 ක් අයවීමට තිබූ අතර එහි කඩ කාමර 46 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසාදමා තිබුණි.

(ඇ) ක්‍රීඩාපිටිය කුලියට දීමේදී සභාව විසින් තීරණය කර තිබූ මිලට වඩා අඩුවෙන් කුලියට දීමෙන් රු.57,500 ක පාඩුවක් සිදුවී තිබුණි.

2.3.5 බලපත්‍ර ගාස්තු

----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය අවසාන වන විට හඳුනාගත් ව්‍යාපාර ස්ථානවලින් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු.295,400 ක් විය.

(ආ) සංචාරක මණ්ඩලය යටතේ අනුමත කර ඇති හෝටල්වලින් අයකරන 1% කට නොවැඩි ව්‍යාපාර බදු අයකිරීමේ දී සහතික කරනු ලැබූ ගිණුම් පරීක්ෂා කර අයකර නොතිබුණි.

2.3.6 වෙනත් ආදායම්

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහා නගර සභාවට අයත් ගිනි නිවීමේ ඒකකය විසින් 2017 වර්ෂය තුළ ගිනි නිවීම් කටයුතු 26 ක නිරත වී තිබූ අතර වර්ෂය අවසාන වන විට අවස්ථා 22 කට අදාළව රු.151,053 ක් අයකරගත යුතුව තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානවල ලියාපදිංචි ත්‍රීරෝද රථ 350 කින් 349 ක්ම බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණු අතර එහි වටිනාකම රු.322,180ක් විය.

2.3.7 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.3,496,553 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 267 වගන්තිය ප්‍රකාරව මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල උපයෝගී කරගනිමින් එම ආඥා පනතේ 272(32) උප වගන්තිය ප්‍රකාරව රථ වාහන නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථානවලින් ගාස්තු අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ක්‍රියාත්මක කරලීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

2017 වර්ෂයේ දී කවෂිමා ව්‍යාපෘතිය යටතේ ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දීර්ඝ කාලීන වැඩපිළිවෙළකට ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් දිගම්පතහ ප්‍රදේශයේ භූමි භාගයක් ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණි. දැනට, ව්‍යාපෘතිය අවසන්කර නොමැති බැවින් එකී භූමි භාගයේ ආසන්න ප්‍රදේශයකට කැලිකසළ අවිධිමත් ලෙස බැහැර කරන බව දක්නට ලැබුණි.

(ඇ) පාරිසරික ගැටළු

------------------

දිගම්පතහ ප්‍රදේශයට බැහැර කරන කුණු කසළ සමඟ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් ඉවත් කරන එළවළු, පලතුරු සමග පොලිතීන් ද මිශ්‍ර වී පවතින අතර ඒවා වන අලින් සහ වෙනත් සතුන් ආහාරයට ගැනීමෙන් එම සතුන්ගේ ජීවිතවලට අවධානමක් පැවතුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව මහා නගර සභාව දැනුවත් වී ඇති අතර ඒ වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදිත රු.12,502,000 කින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වෙනුවෙන් රු.7,323,421 ක් වැය කර තිබුණි. එහිදී දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන වෙනුවෙන් දඹුළුගම හෙළබොජුන්හලක් ඉදිකිරීම හා ග්‍රාමීය කෘෂි මාර්ග සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි.

පරිසරය සුරැකීමේ අරමුණින් කසළින් තොර නගරයක් බිහි කිරීම සඳහා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා නිරෝගී පරපුරක් බිහිකිරීමේ අරමුණින් සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේ සිට අවශ්‍ය සන්ධිස්ථාන හඳුනාගෙන තිබුණි. මේ සඳහා කළමනාකරණ අධීක්ෂණය යටතේ පලපුරුදු නිලධාරීන් 06 දෙනෙකු රාජකාරී යෙදී ඇති අතර එම නිලධාරීන් වෙනුවෙන් ත්‍රෛමාසික පුහුණු වැඩසටහන් පවත්වා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කානු පද්ධතිය පිළිසකර කිරීම සඳහා ලැබිය යුතු රු.52,640 ක මුදලක් වසරක් ගතවී තිබුණ ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රීඩා භූමි කුලියට දීමේ හා ජල බවුසරය කුලියට දීමේ අයදුම්පත් සඳහා විධිමත් නිර්දේශයකින් හෝ අනුමැතියකින් තොරව ගාස්තු අයකර තිබුණි.

(ඇ) වාහන 05 ක් ලියාපදිංචි කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සේවක පුරප්පාඩු

------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 69 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 50% දායකත්වය යටතේ රු.617,227 ක් වටිනා කසළ බඳුන් 200 ක් 2016 වර්ෂයේ දී මහා නගර සභාවට ලැබී තිබූ අතර ඉන් බඳුන් 86 ක් අලෙවි කර තිබුණි. ඉතිරි බඳුන් පිළිබඳව හා මීට පෙර සිට පවතින බඳුන් ප්‍රමාණය පිළිබඳව තොග පොත්වල සටහන් කර නොතිබුණි.

(ආ) තොගපොලේ කඩ කාමර බදු දීම දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදුකර තිබූ අතර දඹුල්ල නගර සභාව සංස්ථාපනය කිරීමෙන් අනතුරුව එම කඩ කාමරවල ගිවිසුම් සහ ලිපිගොනු භාරදී නොතිබීම හේතුවෙන් ගිවිසුම් නොමැති ලිපිගොනු 689 ක් විය.

3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

--------------------------------

දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් පිළිවෙළින් 1995 මැයි 06 දින පැරණි තොගපොළ ඉදිකිරීම් සඳහා රු.12,000,000 ක මුදලක් සහ 2005 සැප්තැම්බර් 30 දින දඹුල්ල බස් නැවතුම්පළ හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.106,859,260 ක මුදලක් ණය වශයෙන් ලබාගෙන තිබුණු අතර, දඹුල්ල මහා නගර සභාව 2011 අප්‍රේල් 01 දින සංස්ථාපනය කිරීමේ දී ඉහත ණය මුදල් දඹුල්ල මහා නගර සභාවට පවරා තිබුණි. දඹුල්ල මහා නගර සභාවට ණය ගෙවීම පැවරීමේ දී අදාළ ගිවිසුම් හා ලිපිලේඛන භාරදී නොතිබීම නිසා දඹුල්ල මහා නගර සභාව විසින් ණය ගෙවීම පැහැර හැර තිබූ අතර 2018 පෙබරවාරි 08 දින වන විටත් ණය මුදල ද ඉක්මවා පොලිය වැඩි වී තිබුණි. මේ අනුව දඹුල්ල තොගපොළ සඳහා රු.38,569,308 ක් හා දඹුල්ල බස්නැවතුම්පළ හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම් සඳහා රු.223,308,146 ක් වශයෙන් ණය ගෙවීමට තිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

----------------------------

3.6.1 පවරානොගත් වත්කම්

-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහා නගර සභාවට ලැබී තිබුණු වාහන 04 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි.

(ආ) ජීප් රථයක් මහා නගර සභාවට ලැබී වසර 4½ ක් පමණ ගතවී තිබුණත් පවරාගැනීමට කටයුතු කර නොමැති අතර 2017 මැයි 19 දිනැති අංක CPC/DMC/1/6/33 අංක දරන ලිපියට අනුව මෙම රථය නැවත ප්‍රධාන ලේකම් වෙත භාරදීමට ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම්දී තිබිය දී 2017 ඔක්තෝබර් 13 දිනැති නාගරික කොමසාරිස්ගේ ලිපියට අනුව රු.460,390 ක ඇස්තමේන්තුවකට අලුත්වැඩියා කිරීමට කටයුතු කර තිබුණි.

3.6.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2015 මාර්තු 26 දින ආරම්භ කළ 'ඊ' නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානය 2015 අගෝස්තු මස සිට මේ දක්වා වසර 2½ ක පමණ කාලයක් අක්‍රියව පවතින අතර ඒ සඳහා ලබාදී තිබූ රු.455,575 ක් වටිනා වත්කම් නිෂ්ක්‍රීයව පැවතුණි. ඒ වෙනුවෙන් ලබාගෙන තිබූ දුරකතන සම්බන්ධතාවය වෙනුවෙන් 2017 වර්ෂය අවසානය දක්වා අක්‍රීය කාලය සඳහා රු.27,406 ක දුරකථන ගාස්තු ගෙවා තිබුණි.

(ආ) තිත්තවැල්ගොල්ල සායන මධ්‍යස්ථානයක් හා කාය වර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.980,000 ක්වැයකර 2014 වර්ෂයේ වැඩ අවසන් කර ඇතත්, පෞද්ගලික ඉඩමක ඉදිකර තිබෙන මෙම ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නගර සභාවට පවරා නොදීම නිසා වසර 03 ක කාලයක සිට එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

3.6.3 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

-------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර නාගරික කොමසාරිස් නිල නිවසේ වත්කම් සම්බන්ධ උපලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

3.6.4 වාහන උපයෝජනය

----------------------

JCB යන්ත්‍රයක් 2017 ජූනි 29 දින අනතුරකට පත් වී රු.111,970 ක හානියක් සිදුවී තිබූ අතර 2018 ජනවාරි 15 වන විට හානිය සිදුවී මාස 6 ක් ඉක්මවා ඇතත් රක්ෂණ හිමිකම් ලබාගැනීමට හා වාහනය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.7 ප්‍රසම්පාදනය

--------------

3.7.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කර්මාන්ත ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී භෞතික ඒකක ප්‍රමාණය නිරීක්ෂණය කර ඒ අනුව ප්‍රමාණ පත්‍ර පිළියෙල නොකිරීම නිසා වැඩ අයිතමවල ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා කළ වැඩ ප්‍රමාණයන්නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත තුනකින් රු.83,871 ක් අඩුවෙන් තක්සේරු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉටුකළ පොහොරන් වැව කපුවත්ත මාර්ග සංවර්ධනය කර ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට භාරදී නොමැති නමුත් අයකළ යුතු රු.9,897 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඇ) දිගම්පතහ කසළ බැම්ම ඉදිකිරීම සඳහා රු.3,300,570 ක් වූ වටිනාකමකට ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර කසළ තල්ලු කිරීම සඳහා ඝන මීටරයක් රු.110 බැගින් කසළ ඝන මීටර් 24280 ක් වෙනුවෙන් වූ රු.2,685,853 ක්, කසළ වැටිය පිළියෙල කිරීම හා තැලීම සඳහා යන්ත්‍ර පැය 100 ක් වෙනුවෙන් පැයකට රු.4,500 බැගින් වූ රු.450,000 ක්, විශ්කම්භය මිලිමීටර් 915 ක් වූ හියුම් පයිප්ප සපයා සවි කිරීම සඳහා වූ

රු.100,000 ක් හා පරිපාලන වියදම රු.64,717 ක් මෙහි ඇතුළත් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) කසළ තල්ලු කර ඉවත් කිරීම සඳහා යන්ත්‍ර පැය පදනම් කරගෙන යන්ත්‍ර පැය 606 ක් සඳහා රු.2,669,040 ක් ගෙවීමට කටයුතු කර තිබුණු නමුත් ඒ සඳහා තාක්ෂණ නිලධාරීන් විසින් ප්‍රමාණ පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1(අ) ප්‍රකාරව ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිත සේවාවට අදාළ වන සියලු පිරිවිතර සඳහන් කර මිල ගණන් කැඳවා නොතිබුණි.

(iii) මිල ගණන් කැඳවීමේ ලේඛනවලට අනුව මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදෙන ලෙස දන්වා තිබුණත් සාමාන්‍ය තැපෑලෙන් ලද මිල ගණන්ද ලංසු ඇගයීමේ දී සලකා බලා තිබූ අතර ලංසු මිල ගණන් ලැබූ ලිපි කවරවල ආයතනයේ දින මුද්‍රා තබා නොතිබීමෙන් ලංසු නියමිත දිනයේම තැබූ බව තහවුරු නොවිණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6(ආ) ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී වීමට අවස්ථාව ලබාදී නොතිබුණි.

(v) ප්‍රසම්පාදන කමිටුව විසින් යන්ත්‍ර පැයකට රු.3,800 ක අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු තෝරාගෙන තිබූ නමුත් නැවත ඉන්ධන සහ ලිහිසි තෙල් සහිතව රු.4,400 ක මුදලකට යන්ත්‍ර සැපයීමට හැකි බවට එම ලංසුකරු ඉදිරිපත් කළ කොන්දේසි යටතේ ගෙවීම් කර තිබුණි.

(vi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ලබාගෙන නොතිබූ අතර 8.9.1(අ) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) කසළ බැහැර කරන භූමිය වටා අලිවැට සකස් කිරීමේ කර්මාන්තය සිදුකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව මිල ගණන් කැඳවා අවම මිල ගණන් ලබාදී තිබූ ආයතනයට රු.1,280,000 කට ලබාදීමට 2018 ජනවාරි 22 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ දී තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) අලිවැට කිලෝමීටරයක දිගකින් යුක්තව ඉදිකිරීමට වනජීවී සංවර්ධන අධ්‍යක්ෂක විසින් 2017 දෙසැම්බර් 20 දිනැති ලිපිය මගින් අවසර ලබාදී තිබූ අතර ඒ සඳහා පිරිවිතර ද ලබාදී තිබුණි. එසේ අවසරය හා අවශ්‍ය පිරිවිතර ලබාදීමට පෙර එනම් 2017 නොවැම්බර් 29 දින එම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් මහා නගර සභාව විසින් මිල ගණන් කැඳවා තිබූ අතර මේ හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 පරිදි උසස් ගුණාත්මකභාවයක් සහිතව කටයුතු කිරීමෙන් බැහැරව නියමිත පිරිවිතර රහිතව මිල ගණන් කැඳවා ඇති බව අනාවරණය විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 ප්‍රකාරව ලංසුකරුගේ සමාන කොන්ත්‍රාත් පිළිබඳ අතීත කාර්ය සාධනය හෝ ගිවිසුගත කාර්ය සාර්ථකව ඉටු කිරීමට කොන්ත්‍රාත්කරුට ඇති හැකියාව සම්බන්ධව පූර්ව සුදුසුකම් පරීක්ෂාවක් කළ යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර එම සංග්‍රහයේ

8.9.1 ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විධිමත් ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට හා 5.4.8 ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) විදුලි වැට ඉදිකිරීම ස්ථානීය පරීක්ෂාවට අනුව විදුලි වැටේ කණු අතර පරතරය මීටර් 15 ක් විය යුතු වුවත් බොහෝ ස්ථානවල ඊට වඩා වැඩි පරතරයෙන් යුක්ත වූ අතර විදුලි වැටෙහි ස්ප්‍රීන් ගේට්ටු මීටර් 4 ක දිගින් යුක්ත වන ලෙසට එකඟවී තිබුණ ද ගේට්ටු දෙකෙහි දිග මීටර් 4.25 ක් හා මීටර් 5.8 ක් වී තිබුණි. එසේම සවිකර තිබූ විදුලි උපාංග නිසි ප්‍රමිතියෙන් යුක්ත ද යන්න තහවුරු කරගැනීමට වගකීම් සහතික ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) විදුලි වැටෙහි භෞතිකව ඉටු නොකළ මීටර් 45.85 ක ඉදිකිරීම් වෙනුවෙන් රු.35,763 ක් ගෙවා තිබුණි.

(ඉ) කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා රු.905,975 ක් වටිනා බේල් යන්ත්‍රයක් මිලට ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1(අ) ප්‍රකාරව අවශ්‍ය යන්ත්‍රයේ පිරිවිතර අවශ්‍ය ප්‍රමාණයට විස්තර කොට මිල ගණන් කැඳවා නොතිබූ අතර සැපයුම්කරු තෝරා ගැනීමේදී ද පිරිවිතර ඇගයීම වෙනුවට මිල ගණන් ඇගයීම පමණක් සිදුකර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 පරිදි ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම කර නොතිබුණි.

(ඊ) නගර සභා බල ප්‍රදේශයේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගලි වලක් ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තු සකසා නොතිබිය දී මිල ගණන් කැඳවා තෝරාගත් ආයතනයක් මගින් කර්මාන්තය ඉටුකරවාගෙන බිල්පත් හෝ වැඩ විෂය නිමැවුම් වාර්තා හෝ ලබානොගෙන කර්මාන්තය වෙනුවෙන් යන්ත්‍ර පැය 67.2 ක් සඳහා රු.302,400 ක් ගෙවා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ දී සෘජු ශ්‍රමය මත ඉටුකළ කර්මාන්ත නියැදි පරීක්ෂාවේ දී ලබාදී තිබූ ද්‍රව්‍ය ඇස්තමේන්තු තුළ ඇතුළත් කර තිබූ සිමෙන්ති ප්‍රමාණයට වඩා ඒ සඳහා සත්‍ය වශයෙන් පාවිච්චි කර තිබූ සිමෙන්ති ප්‍රමාණය වෙනස් වූ අතර කර්මාන්තය සඳහා භාවිතා කර තිබූ සිමෙන්ති ප්‍රමාණයට වඩා ගබඩාවෙන් නිකුත් කර ඇති සිමෙන්ති ප්‍රමාණය වැඩි වී තිබීම නිසා කර්මාන්ත 02 ක් සඳහා රු.32,485 ක් වටිනාකමැති සිමෙන්ති මිටි 13½ ක් නිකුත් කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයන් හා උප විෂයන් 86 කට අදාළව සලසා දී තිබූ රු.10,233,000 ක එකතු වටිනාකමකින් යුත් ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයන් හා උප විෂයන් 94 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර 27% සිට 99% දක්වා වූ පරාසයක විචලනයන් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ප්‍රමාණවත් පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අභ්‍යන්තර විගණන ඒකකය තුළ එක් නිලධාරියෙකු කටයුතු කරන අතර 2017 වර්ෂය තුළ විගණන විමසුම් 04 ක් පමණක් නිකුත් කර තිබුණි. එම විගණන විමසුම්වල පිටපත් මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජූනි 09 දිනැති DMA/2009(1) අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ ප්‍රකාරව හා 2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුව ද සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ කමිටු 03 ක් පමණක් පවත්වා තිබුණි.

4.4 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 14 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විගණන විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.57,276,519 ක් විය.

5. පද්ධති හා පාලනය

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගබඩා පාලනය | i. ගබඩා ලැබීම් හා නිකුත් කිරීම් විධිමත් පරිදි සටහන් නොකිරීම.<br>ii. කොඩි කණු 110 ක් හා කොම්පෝස්ට් බඳුන් 200 ක් තොග ලේඛනවල සටහන් නොකිරීම.<br>iii. ආයුර්වේද මධ්‍යස්ථානයේ ලැබුණු තොග, ගබඩා ලේඛනවල සටහන් නොකිරීම, නිකුත් කිරීම් නිසිකලට යාවත්කාලීන නොකිරීමෙ හා කල් ඉකුත් වූ ඖෂධ ගබඩාවෙන් ඉවත් නොකිරීම. |
| (ආ) මිලදී ගැනීම් | i. ප්‍රසම්පාදන තීරණ සටහන් කිරීම අසම්පූර්ණ වීම, අවශ්‍ය පිරිවිතර සඳහන් නොකර මිල ගණන් කැඳවීම, ප්‍රසම්පාදන තීරණ අනුව තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් වැඩි මිලට භාණ්ඩ මිලට ගැනීම, දිනයන් රහිත මිල ගණන් වැඩි වශයෙන් ලබාගෙන තිබීම. |

ii. බාහිර පාර්ශවයන්ගෙන් ආයතනය වෙත ලැබෙන ලිපි ලේඛනවල දින මුද්‍රා තබා දිනය තහවුරු කර නොතිබීම.

(ඇ) වත්කම් පාලනය

i. ස්ථාවර වත්කම් ලේඛන විධිමත් ආකාරයට පවත්වා නොතිබීම.
ii. සභාව සතුව පවතින ඉඩම්වල අයිතිය තහවුරු කරන ලේඛන නොතිබීම.
iii. සභාව සතු වාහන කීපයක ලියාපදිංචි සහතික නොතිබීම.
iv. මහා නගර සභාවට ලැබී තිබූ වත්කම් සභාවේ නමින් පවරාගෙන නොතිබීම.

(ඈ) ගිණුම්කරණය

i. ඉඩම් හා වාහන සැලකිය යුතු ප්‍රමාණයක් ගිණුමට ඇතුළත් කර නොතිබීම.
ii. ගිණුමට ඇතුළත් වී තිබූ ආදායම් නිවැරදිව ශීර්ෂගත නොකිරීම හා ඉදිරිපත් කර තිබූ උපලේඛන තුලනය නොවීම.
iii. ලෙජර් ගිණුම් විධිමත් ආකාරයට පවත්වාගෙන නොතිබීම හා ජර්නල් සටහන් යෙදීමේ දී නිවැරදි ගිණුම් හඳුනාගෙන නොතිබීම.